# මට සිනමාව ගැන පිපාසයක් තිබුනා

## - නයනා කුමාරී



### රඟපෑමට අමතරව අලුත් කටයුත්තක් ආරම්භ කළා නේද?

ඇත්තටම ඔව්, මේක ලෝකයේ කවුරුත්ම නොකළ දෙයක්. රූපලාවන්‍ය ශිල්පි ශිල්පිනියන් පිරිසක් එකම වේදිකාවකට ගෙනල්ලා ඔවුන්ගේ නර්ථනයන් ඉදිරිපත් කිරීමක් ලෝකේ කොහෙවත් වෙලා නැහැ. නළු නිළියෝ, ගායක ගායිකාවන් අපි නිතර ප්‍රසංග හරහා දකිනවා. ඒත් රූපලාවන්‍ය ශිල්පීන් එවැන්නකට සහභාගී කරවගන්නේ නැහැනෙ. ඒ නිසා මේක අලුත් දෙයක්. සිංහල, ද්‍රවිඩ, හින්දි චිත්‍රපටවල ජනප්‍රිය ගීත වලට රූපලාවන්‍ය ශිලපීන් රැසක් මේ වෙනුවෙන් දායක වෙනවා. මම, ගයත්‍රි සහ අනූජ් තමයි මෙය කරන්නේ.

### රංගන කටයුතු කොහොමද?

අලුත් ටෙලිනාට්‍ය හතරකට පමණ සම්බන්ධ වුනා. ආදරය ගින්දරක් සහ කාසිවත්ත මේ දිනවල විකාශය වෙනවා. ඊට අමතරව, නාලක තලගලගෙ නාට්‍යයක සහ සුධර්මා නෙත්තිකුමාර නිශ්පාදනය කරන නාට්‍යයකට දායක වුනා.

### රූපවාහිනියෙන් දැක්කට සිනමාවේදී ඔබ දුලබ දර්ශනයක්.

ඇත්ත. ටෙලිනාට්‍ය ක්ෂේත්‍රයට පැමිණිලා වසර විසිපහක්. චිත්‍රපටවලදී මට කරන්න ලැබුන චරිතවලට මට එකඟ වෙන්න බැරිව මම ප්‍රතික්ෂේප කළා. ඒ එක චරිතයක් පසුව කළේ සංගීතා වීරරත්න. ඒ 'සළෙළු වරම්' චිත්‍රපටිය. එහි අධ්‍යක්ෂක වසන්ත ඔබේසේකර මහතා මගේ නාට්‍යවල රංගනයන් අගය කළ කෙනෙක්. ඒත් ඒ චිත්‍රපටයේ සමහර දර්ශන වලට පෙනී සිටීමට මම කැමති වුනේ නැහැ. පසුව සංගීතා එහි රඟපාලා සම්මානයටද පාත්‍ර වුනා. ඒ ආකාරයටම මට ඉන්දිය චිත්‍රපටයකුත් ලැබුනා. එයත් මා ප්‍රතික්ෂේප කළා. හොඳ චරිත, හොඳ චිත්‍රපට ලැබුනා. ඒත් ඒවා මට කරන්න අපහසු නිසා මගෙන් ගිලිහුනා. මම අද ඒ දිහා උපේක්ෂාවෙන් බලනවා මිසක් ඒ ගැන දුක්වෙන්නෙ නැහැ.



### ඒ කියන්නේ ඔබ ඉන්නේ නිළියක් කියන තැන නෙවෙයිද?

ඇත්තටම මට සිනමාව ගැන පිපාසයක් තිබුනා. ඒත් නිළියකට වඩා මම ගැහැනියක් කියන තැන ඉදලයි කටයුතු කරන්නේ. මොකද නයනා කුමාරී කියන ගැහැනිය තමයි පසුව නිළියක් වුනේ. හැම චරිතයක්ම කරන අයව මම අගය කරනවා. කාවවත් විවේචනය කරන්නේ නැහැ.

### ටෙලි නාට්‍ය රංගනය තුළ ඔබ තෘප්තිමත්ද?

ඇත්තටම ඔව්. සිනමාව තුළ මට විශාල දෙයක් කරන්න බැරි වුනේ මම මගේ සීමාව තුළ සිටි නිසා. ඒත් මම ටෙලිනාට්‍ය තුළ විවිධ අධ්‍යක්ෂකවරු යටතේ විවිධ චරිත රඟපාලා තියෙනවා. ඒ වගේම ඒ වෙනුවෙන් මට ලැබිය යුතු හැම සම්මානයක්ම ලැබිලා තියෙනවා. හොඳම නිළිය, ජනප්‍රිය නිළිය, සහය නිළිය ආදී හැම සම්මානය ක්ම මට ලැබුනා. ඉතින් ඊට වඩා තෘප්තියක් කොහින්ද?

බුද්ධිනී ජයවර්ධන

# EVENT

## කලා ගමේ අවුරුදු











ඡායාරූප - ෂිතන් ගුණවර්ධන